015

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන - 2011

ළමා සාහිත්‍යය - ESC 2220

කාලය - පැය තුනයි.

---

දිනය - 2011.09.04 වේලාව - ප.ව. 01.30- ප.ව. 04.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද දෙවන කොටසේ ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.

## I කොටස

01. ළමා සාහිත්‍යය බෙදෙන පුළුල් අංශ තුන (03) නම් කරන්න.

02. ළමුන් සඳහා උචිත කතාන්දරයක ලක්ෂණ තුනක් (03) ක් ලියන්න.

03. පෙර පාසල් වියේ දරුවන්ට උචිත පද්‍යයක තිබිය යුතු ලක්ෂණ හතරක් (04) දක්වන්න.

04. කුඩා කාලයේ සිටම ළමුන්ව කියවීම සඳහා යොමු කිරීම වැදගත් ය. කියවීම නිසා ළමුන්ට ලැබෙන වාසි හතර (04) ක් ලියන්න.

05. පෙර පාසල තුළ ළමා පුස්තකාලයක් පවත්වාගෙන යාමෙන් ගුරුභවතාට වන වාසි 03 ක් ලියන්න.

06. ළමයින් සඳහා විකාශයට උචිත රූපවාහිනී වැඩ සටහන් තුනක් (03) නම් කරන්න.

07. පෙර පාසල් වියේ දරුවන් සඳහා තේරවිලි සම්බන්ධ ක්‍රියාකාරකම් සංවිධානයේ වැදගත්කම දක්වන්න.

08. දරුවන්ට උචිත පොතක් තෝරා ගැනීමේදී සැලකිළිමත් විය යුතු කරුණු තුනක් (03) ලියන්න.

(ලකුණු 5 x 8 = 40)

## II කොටස

09. (i) ළමා සාහිත්‍යය යන්න හඳුන්වන්න.
(ලකුණු 10)

(ii) ළමුන්ගේ මානසික සංවර්ධනයට ළමා සාහිත්‍යය යොදාගත හැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 10)

10. (i) ළමා ගද්‍ය සාහිත්‍යය බෙදෙන උපාංග දක්වන්න.
(ලකුණු 10)

(ii) දරුවන්ගේ භාෂා කුසලතා වර්ධනයට ගද්‍ය සාහිත්‍යය දායකවන ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 10)

11. (i) වත්මන් ලාංකික සමාජයේ දරු නැළවිලි ගී වලට හිමි වී ඇති ස්ථානය පිළිබඳව සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

(ii) දරු නැළවිලි ගී දරුවන්ගේ යහපත් චිත්තවේග සඳහා දායක වේ. මේ පිළිබඳව අදහස් දක්වන්න.
(ලකුණු 10)

12. (i) ළමුන්ට කතන්දරයක් ඉදිරිපත් කිරීමේදී දියුණුකර ගතයුතු පෞරුෂ අංග (ශිල්පීය ක්‍රම) දක්වන්න.
(ලකුණු 10)

(ii) ඔබ ඉහත සඳහන් කළ අංග වලින් දෙකක් (02) පැහැදිලි කරන්න.
(ලකුණු 10)

13. පහත මාතෘකාවලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ළමා පුවත්පත් හා සඟරා
(ii) සන්නිවේදනය හා ළමාකවි
(iii) ළමා පොතපත
(iv) ළමුන්ට පොත් තෝරා දීමේ වැදගත්කම

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -